# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/65 - 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

**නියෝග**

2020 දෙසැම්බර් මස 23 වැනි දින අංක 2207/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසාන වරට සංශෝධනය කරනු ලැබුවා වූ, 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

එහි 8(3) (අ) නියෝගය

(3) (අ) අමාත්‍යවරයා විසින්, අභියාචනය සලකා බැලීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් නිර්දේශ තමා වෙත ඉදිරිපත් කිරීම සඳහා සාමාජිකයන් දසදෙනෙකුගෙන් සමන්විත අභියාචන උපදේශක කමිටුවක් සහ එම කමිටුවේ කටයුතු පහසු කරනු පිණිස ලේකම් තනතුරක් ද පිහිටුවනු ලැබිය හැකි ය. එම කමිටුවේ සාමාජිකයන් විසින් දෙනු ලබන කිසිදු නිර්දේශයකට අමාත්‍යවරයා සීමා නොවිය යුතු ය.

**රොෂාන් රණසිංහ (පා.ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0201

1A - G 40158 — 07 (2023/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.